අතීතයේ යම් යම් වෘත්තීන් හා පැවතුණු පසුගාමී ආකල්පයන් සමඟින් එම වෘත්තීන්ට අදාළව ඇතැම් යෙදුම් නිර්මාණය වී තිබේ. "හාම්පුතා" සහ "මෙහෙකරුවා/මෙහෙකාරිය" වැනි යෙදුම් ඊට උදාහරණ නොවන්නේ දැයි පාඨක අප විමසිය යුතු වේ. එසේ නම්, වර්තමානයේ දක්නට ලැබෙන වඩාත් නිදහස්, වඩාත් වෘත්තිමය සබඳතාවයන් පසුතල කොට සලකන විට, "හාම්පුතා" සහ "මෙහෙකරුවා/මෙහෙකාරිය" වැනි යෙදුම්න් තවමත් භාවිතා කළ යුතුද යන්න පැනයකි.

උදාහරණයක් ලෙසින්, "වැඩට ඇවිත් මාස තුනෙන් මෙහෙකාරිය රන් බඩු අරන් පනී", "ව්‍යාපාරික බිරිඳ රවටා ලක්ෂ 15 ක රන්බඩු වංචා කළ මෙහෙකාරිය මාට්ටු" වැනි සිරස්තල දැක්විය හැක. මෙහිදී එක් සිරස්තලයක "මෙහෙකාරිය" යනුවෙන් සඳහන් වූවත්, එම පුවත් අන්තර්ගතයේ සඳහන් වන්නේ "ගෘහ සේවිකාව" යනුවෙන් බවද සැලකිල්ලට ගැනීම වටී.

ඒ අනුව,

1) ඔබ සිතනා ලෙසට, සේවානියුක්ත-සේවායෝජක වැනි වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයන් තුළ "මෙහෙකාරිය" යන යෙදුම කෙතරම් උචිත ද?

2) ඒ වෙනුවට "ගෘහ සේවිකාව" හෝ "සේවිකාව" වැනි යෙදුම් වඩාත් උචිත යැයි ඔබ නොසිතන්නේ ද?